# සාරාංශය

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨය මගින් පවත්වා ගෙන යනු ලබන පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන හදාරන ගුරු ශිෂ්‍යයින් විසින් ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණුව අදියර දෙකකදී සිදු කරනු ලැබේ. පළමු අදියරේදී ගුරු පුහුණුව අධීක්ෂණය කරනු ලබන්නේ ප්‍රමුඛාචාර්යවරුන් විසිනි. විවිධ පර්යේෂණ අනාවරණවලට අනුව ප්‍රමුඛාචාර්යවරු ගුරු ශිෂ්‍යයින්ගේ වෘත්තිය සංවර්ධනය පිළිබඳ අඩු සැලකිල්ලක් දක්වමින් ඇගයීම් කාර්යයට පමණක් නැඹුරු වී ඇති තත්ත්වයක් හෙළි විය. මෙම ගැටලුවට පිළියමක් ලෙස පීඨය මගින් ගුරු පුහුණුව පළමු අදියරේ දී ගුරු ශිෂ්‍යයින්ගේ වෘත්තිය සංවර්ධනය අපේක්ෂාවෙන් පාසල් උපාධ්‍යායවරු පත් කරන ලදි. එහෙත් උපාධ්‍යායවරුන්ද ඔවුන්ට අදාළ භූමිකා නිසි පරිදි ඉටු නොකරන බවට චෝදනා එල්ල විය.

උපාධ්‍යායවරුන් ගුරු ශිෂ්‍යයින්ගේ වෘත්තිය සංවර්ධනය සඳහා විවිධ භූමිකා ඔස්සේ දක්වන ලද දායකත්වය පිළිබඳව විමසා බැලීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන පරමාර්ථය විය. එහිදී උපදේශකයකු, අභිප්‍රේරකයකු, ආදර්ශ සපයන්නකු සහ තක්සේරුකරුවකු වශයෙන් උපාධ්‍යායවරයකුගෙන් අපේක්‍ෂා කළ භූමිකා පිළිබඳ අධ්‍යයනය කරන ලදි. මේ සම්බන්ධව උපාධ්‍යායවරුන්ගෙන් සහ ගුරු ශිෂ්‍යයින්ගෙන් අදහස්, ගැටලු හා යෝජනා විමසා බැලීම සඳහා ද අවධානය යොමු කරන ලදි.

විස්තරාත්මක පර්යේෂණ ක්‍රමය යටතේ සිදු කරන ලද මෙම අධ්‍යයනය සඳහා සාහිත්‍ය විමර්ශනය, ප්‍රශ්නාවලි සම්මුඛ සාකච්ඡා සහ ලේඛන හා වාර්තා මඟින් අදාළ දත්ත සපයා ගනු ලැබුණි. උපාධ්‍යායවරුන් 48ක් සහ ගුරු ශිෂ්‍යයින් 48ක් වෙත ප්‍රශ්නාවලි ලබා දෙන ලද අතර එම මුළු නියැදියෙන් 30%ක් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වා දත්ත ලබා ගන්නා ලදි.

මෙසේ විවිධ ක්‍රම යටතේ ලබා ගත් දත්ත විස්තරාත්මක සංඛ්‍යා ලේඛන ක්‍රම භාවිත කරමින් විශ්ලේෂණය කරන ලදි. දත්ත විශ්ලේෂණයේ දී උපාධ්‍යායවරුන් බහුතරයක් විසින් ඔවුන්ගේ භූමිකා විශ්වවිද්‍යාලය මඟින් අපේක්‍ෂිත අයුරින් ඉටු කර නොමැති බව ද එහෙත් ඇතැම් උපාධ්‍යයවරුන් විසින් වගකීමෙන් හා කැපවීමෙන් යුතුව තම භූමිකා ඉටු කර ඇති බව ද අනාවරණය විය.

එසේ වුවත් උපාධ්‍යායවරයෙකුගේ අවශ්‍යතාව පවතින බව තොරතුරුවලින් හෙළි වූ අතර, එය ඊට සම්බන්ධ සෑම පාර්ශ්වයකම පාහේ අදහස විය. එසේම උපාධ්‍යයනය නිසි පරිදි සිදු නොකිරීම කෙරෙහි සෘණාත්මක ආකල්ප, කාලය ප්‍රමාණවත් නොවීම, පුහුණුව ප්‍රමාණවත් නොවීම සහ නිසි අභිප්‍රේරණයක් සිදු නොවීම ආදී ගැටලුද පැවති බව අනාවරණය විය.

විධිමත් ලෙස මෙම ක්‍රියාවලිය හැඩගස්වා ගැනීම පවතින සම්පතකින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමකි. ඒ සඳහා අවශ්‍ය පසුබිම සකසා ගැනීමට උපාධ්‍යයනය ගුරු ශිෂ්‍යයින්ගේ වෘත්තිය සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය ක්‍රියාවලියක් බව, ඒ කෙරෙහි උපාධ්‍යායවරුන්ගේ සහ ගුරු ශිෂ්‍යයින්ගේ ධනාත්මක ආකල්ප සංවර්ධනය කළ යුතු බව, උපාධ්‍යයනය සඳහා

නිශ්චිත කාලයක් වෙන් කළ යුතු බව, උපාධ්‍යයනය සඳහා සුදුසුකම් ලත්, ප්‍රවීන ගුරුවරුන් පමණක් පත් කළ යුතු බව, දුෂ්කර පාසල්වල උපාධ්‍යයනය නිසි පරිදි සිදු කිරීමේ බාධක පවතින බව, උපාධ්‍යයනය සම්බන්ධයෙන් විදුහල්පතිවරුන් දැනුවත් කළ යුතු බව, පාසල් පරිපාලකයන් උපාධ්‍යයක භූමිකාව සඳහා යොදා නොගත යුතු බව, උපාධ්‍යයනය හා සම්බන්ධ ලේඛන හා වාර්තා පවත්වා ගත යුතු ආකාරය පිළිබඳව උපාධ්‍යායවරුන් තව දුරටත් දැනුවත් කළ යුතු බව ආදී මෙම අධ්‍යයනයෙන් සිදු වූ අනාවරණ ප්‍රයෝජනවත් වනු ඇත.

මෙම අධ්‍යයනයෙන් හෙළි වූ අනාවරණ ආශ්‍රිතව උපාධ්‍යයනය සම්බන්ධයෙන් උපාධ්‍යායවරුන්ගේ හා ගුරු ශිෂ්‍යයින්ගේ ධනාත්මක ආකල්ප සංවර්ධනය කිරීම, උපාධ්‍යයනය සඳහා නිශ්චිත කාලයක් වෙන් කිරීම, සුදුසුකම් සහිත උපාධ්‍යායවරුන් පත් කිරීම, උපාධ්‍යායවරු පත් කිරීම සඳහා විශ්ව විද්‍යාලය මැදිහත් වීම, පාසල් පරිපාලන කටයුතුවල යෙදෙන්නන් උපාධ්‍යයනය සඳහා සම්බන්ධ කර නොගැනීම, ගුරු ශිෂ්‍යයින්ගේ විෂය ක්ෂේත්‍රයට අදාළව උපාධ්‍යායවරුන් පත් කිරීම, උපාධ්‍යායවරුන් සඳහා පුහුණුව විධිමත් කිරීම, ඔවුන්ගේ සේවය සඳහා කරනු ලබන ගෙවීම වැඩි කිරීම ආදී යෝජනා පර්යේෂකයා විසින් ඉදිරිපත් කර ඇත.,

උපාධ්‍යයනයේ ඇති ගැටලු අවම කර ගනිමින් නියම උපාධ්‍යායවරුන් පිරිසක් බිහි කර ගැනීම අත්‍යවශ්‍යය. ඒ තුළින් වෘත්තීය සංවර්ධනයෙන් යුතු ගුරු පිරිසක් සහ මනා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සඳහා අවශ්‍ය පසුබිම සකස් කළ හැකි වනු ඇත.